## ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2016

------------------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනතේ 25 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

---

ප්‍රමිතයේ 70 හා 71 වගන්ති පරිදි මූල්‍ය වාර්තාකරණ දිනයේ සිට මාස 12 කට පෙර සහ මාස 12 කට පසු අයකර ගැනීමට බලාපොරොත්තුවන වත්කම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කළයුතු වුවද ආයතනයේ රු.44,549,328 ක් වූ ආපදා ණය ශේෂය ඒ අනුව වර්ගීකරණය කර දක්වා නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

---

(I) ප්‍රමිතයේ 47 වගන්තිය පරිදි දේපළ , පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට වාර්ෂික ප්‍රත්‍යාගණනයන් සිදුකිරීම සහ ප්‍රමාණාත්මක නොවන වෙනස්කම් සහිත දේපල පිරියත හා උපකරණ සඳහා නිතර සිදුකරන ප්‍රත්‍යාගණනයන් අවශ්‍ය නොවුවද වසර 03 කට හෝ වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය සිදුකිරීම ප්‍රමාණවත් වුවත්, අධිකාරිය 2012 වර්ෂයෙන් පසුව සියළුම වත්කම් වෙනුවෙන් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොතිබුණි.

(II) ප්‍රමිතයේ 64 වගන්තිය පරිදි වත්කම් සඳහා වූ ඵලදායී ජීවිත කාලය සළකා වාර්ෂික ක්ෂය අනුපාතය තීරණය කළයුතු වුවත් , එයට පටහැනිව අධිකාරිය විසින් තාක්ෂණික හේතූන් මත සීඝ්‍රයෙන් යල්පැනීමට ලක්වන පරිගණක මෘදුකාංග සහ විද්‍යාගාර උපකරණ වසර 10 ක ඵලදායී ජීවිත කාලයක් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08**

---

ප්‍රමිතයේ 22 වගන්තිය පරිදි අධිකාරියට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් 2011 වර්ෂයේදී පවරා තිබූ නඩුවක් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.12,734,000 ක වන්දි මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. මේ සඳහා ඉකුත් වර්ෂවල ප්‍රතිපාදන සලසාගෙන නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩිවී තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය තුළදී කිරි ගවයින් 06 දෙනෙකු රු.309,945 ක වටිනාකමට අගය කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 132 (ඇ) වගන්තිය පරිදි එසේ අගය කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණු අතර ධාරණ අගය වැඩිවීමෙන් වූ අතිරික්තය වූ රු.209,995 ක් ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවසාන තොගය ගණනය කිරීමේදී මත්ස්‍ය වගා කටයුතු සඳහා මිළදීගෙන තිබූ රු.361,958 ක් වූ දැල් තොගය අතහැරී තිබීම හේතුවෙන් අවසන් තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ කිහිපයක සිට පැවත එන අවස්ථා 175 කදී එකතුව රු. 1,543,141 වූ ඍජු බැංකු බැරකිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම වෙනුවට මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 30 දින සිට භාවිතයට ගෙන තිබූ රු.6,500,000 ක් වූ මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.975,000 ක ක්ෂය ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඈ) උඩවලව තිලාපියා මධ්‍යස්ථානයේ ඉදිකරන ලද රු.1,967,756 ක් වූ මඩපොකුණු 2016 ජනවාරි 12 දිනදී නිමකර භාවිතයට ගෙන තිබුණද අදාල වත්කම් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගත කර තිබුණි. මේ හේතුවෙන් ඊට අදාල රු.114,183 ක් වූ ක්ෂය ගිණුම්ගත කිරීම මගහැරී තිබුණි.

(ඉ) ආයතනයේ ඉංජිනේරුවරයාට ගෙවන ලද වැඩබිම් නිරීක්ෂණ ගාස්තු , කමිටු සාමාජික ගාස්තු සහ දැන්වීම් ගාස්තුව වූ රු.387,051 ක් පරිපාලන වියදම් යටතේ දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

| විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| දිවිනැගුම - චක්‍රීය අරමුදල | 32,679,030 | - i. නැවත අයකරගැනීම් පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය<br>- ii. ණයගැති කාල විශ්ලේෂණය. |
| දිවිනැගුම - මත්ස්‍ය ඇඟිල්ලන් තොගය | 1,258,960 | - ඇඟිල්ලන්ගේ වර්ගීකරණය සහිත උපලේඛන |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මත්ස්‍ය පැටවුන් විකිණීමෙන් ඇතිවූ රු.13,739,176 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ඉක්මවූ රු.3,041,702 ක් හා වර්ෂ 03 ඉක්මවූ රු.1,779,992 ක් අයකර ගැනීමේ කටයුතු මන්දගාමීව පැවතිණි.

(ආ) වසර 05 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් රු.363,329 ක් වූ රඳවා ගැනීමේ බදු ශේෂය (WHT) නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2001 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා පැවත එන රු.8,377,714 ක් වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් රඳවා ගැනීමේ ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 751 | පුස්තකාලයට ලැබෙන සියලුම පොත්, පරිග්‍රහණ ලේඛන පොතෙහි ඇතුළත් කළයුතු වුවද, 2016 දෙසැම්බර් 31 දිනට පුස්තකාලයේ පවතින සියලුම පොත් පරිග්‍රහණ ලේඛනවල ඇතුළත් කර නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය හා 3.1.7 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඊට අදාළ වාර්තා විගණකාධිපති වෙත සපයා නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවති ලැබිය යුතු කල්බදු කුලිය රු.403,594 ක් හා අවලංගු කළ චෙක්පත් ගිණුමේ රු.149,203 ක් පිළිවෙලින් නීති වියදම් ගිණුමෙන් සහ වෙනත් ආදායම් ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණද මේ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.36,533,378 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.11,443,032 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.47,976,410 කින් පිරිහී තිබුණි. රාජ්‍ය ප්‍රදානයන් හා විලම්භිත ආදායම් පිළිවෙලින් රු.26,509,750 ක් හා රු.21,270,580 කින් වැඩිවුවද , පරිපාලන වියදම් රු.63,475,658 ක් හා බෙදාහැරීම් වියදම් රු.26,957,218 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු. 20,364,390 ක් වූ ඌනතාවය 2015 වර්ෂයේදී රු. 11,443,032 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණද 2016 වර්ෂයේදී නැවතත් රු.36,533,378 ක ඌනතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.208,579,857 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.377,818,292 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

--------------------------------------------------------

සේවකයෙකු විසින් නැවත රැකියාව ලබාගැනීම සඳහා 2015 ජුනි 22 දින ආයතනයට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

2006 අංක 23 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව එහි කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) රට තුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩිකිරීමේ අරමුණින්, මිරිදිය, කිවුල්දිය, වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩි දියුණු කිරීම හා එමගින් රැකියා අවස්ථා ඇතිකර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

(ආ) අපනයනය සඳහා විසිතුරු මත්ස්‍ය විශේෂ ඇතුලුව වැඩි වටිනාකමක් ඇති මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම සහ ජලජීවී වගාව සඳහා පෞද්ගලික අංශයේ සුළු , මධ්‍යම හා මහා පරිමාණ ආයෝජන ප්‍රවර්ධනය කිරීම , පහසුකම් සැලසීම සහ වැඩිදියුණු කිරීම.

(ඇ) ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි , ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම , සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක කිරීම.

(ඈ) ජලජ සම්පත් ආනයනකරුවකු , අපනයනකරුවකු , අලෙවිකරුවකු , සපයන්නකු හා බෙදාහරින්නකු ලෙස ව්‍යාපාරය කරගෙනයාම සහ එම කාර්යයන්හි යෙදී සිටින තැනැත්තන්ට සහාය වීම යනාදිය වේ.

සමාලෝචිත වර්ෂය තුළදී ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යයක් වූ ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි ජලජීවී වගාව සහ ජලජීවී වගා මෙහෙයුම් සඳහා යොදාගනු ලබන ජලජ සම්පත් සහ නිත්‍ය සහ කාලීන ජලාශයන්හි වගාව පදනම් කරගත් ධීවර කර්මාන්තය කළමනාකරණය කිරීම , සංරක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වූ සැලසුම් හා පරිසර හිතකාමී වගා වැඩසටහන් සකස්කර ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් මිරිදිය ජලාශ වල මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී මිලියන 12.6 කින් වැඩිවී තිබූ අතර ඇඟිල්ලන් තැන්පත් කිරීම තුළින් ලබාගන්නා ප්‍රගතිය (පසු අස්වැන්න) මැනීම හා වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් රජයේ එකම පර්යේෂණ හා සංවර්ධන ආයතනය වන ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මගින් මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කරගැනීම සඳහා උපදෙස් හා පර්යේෂණ සිදුකර ගැනීමද කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිෂ්පාදනය කල මිරිදිය මත්ස්‍ය ඇසිත්තන් හා ඇඟිල්ලන් පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදී මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය මිලියන 40.98 ක් වී තිබූ අතර වගා නිෂ්පාදනය මෙ.ටො 70,600 ක් විය. 2014 වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 66.47 කින් වැඩිවී තිබුණද මත්ස්‍ය නිෂ්පාදන මෙ.ටො. 67,480 දක්වා අඩුවී තිබුණි.

(ii) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මත්ස්‍ය ඇසිත්තන් නිෂ්පාදනය මිලියන 83.10 සිට මිලියන 112.27 ක් දක්වා මිලියන 29.17 කින් වැඩිවී තිබුණද මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය ඊට සාපේක්ෂව වැඩිවී නොතිබුණි.

(iii) 2014 වර්ෂයට සාපේක්ෂව 2015 හා 2016 වර්ෂවල මිරිදිය ජලජීවී වගා නිෂ්පාදනය පිළිවෙලින් මෙ.ටො.10,390 කින් හා මෙ.ටො 3,120 කින් අඩුවී තිබුණි.

(iv) 2015 සහ 2016 වර්ෂයේ තොරතුරු අනුව පිළිවෙලින් දිස්ත්‍රික්ක 11 ක සියයට 25 සිට සියයට 73 දක්වා වූ පරාසයකින් සහ දිස්ත්‍රික්ක 06 ක සියයට 23.5 සිට සියයට 75 දක්වා වූ පරාසයකින් ඇඟිල්ලන් තැන්පත් කිරීමේ ඉලක්ක සපුරා නොමැති බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබූ අතර ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වන මත්ස්‍ය සම්පත් ප්‍රවර්ධනය යන අරමුණ ප්‍රමාණවත් ලෙස ඉටුවී නොතිබුණි.

(v) 2015 සහ 2016 වර්ෂය තුළදී ගම්පහ, කළුතර , මාතර , කෑගල්ල යන දිස්ත්‍රික්ක වල පිහිටා ඇති මිරිදිය ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමේ ඉලක්කයන් ලෙස අධිකාරිය විසින් අදාල මධ්‍යස්ථානවලට ලබාදී තිබුනේ පිළිවෙලින් මිලියන 0.334 , 0.345 , 0.349 හා 0.054 ක් වුවත් එම දිස්ත්‍රික්ක ආවරණය වන ආකාරයට කිසිදු මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීමක් සිදුකර නොතිබුණි. මේ අනුව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ පාරිභෝජනය වැඩි දියුණු කිරීම හා ධීවර ජනතාවගේ රැකියා අවස්ථා ඇතිකර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම යන අරමුණ ඉටු වී නොතිබුණි.

(ඈ) ආයතනය, රටතුළ මත්ස්‍ය නිෂ්පාදනය සහ පරිභෝජනය වැඩි දියුණු කිරීමේ අරමුණින් මිරිදිය කිවුල්දිය , වෙරළබඩ හා සමුද්‍රීය ජලජීවී වගාව වැඩිදියුණු කිරීම හා එමගින් රැකියා අවස්ථා ඇතිකිරීම හා ප්‍රවර්ධනය යන අරමුණ ඉටුකරගැනීම සඳහා 2011, 2012 , 2013 සහ 2014 යන වර්ෂ වලදී දිවිනැගුම ණය යෝජනා ක්‍රමය මගින් ප්‍රතිලාභීන් 6450 ක් සඳහා රු.229,035,250 ක් ලබාදී තිබුණද එම වැඩසටහන පහත සඳහන් හේතු නිසා අසාර්ථක වී තිබුණි.

- ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී එම ප්‍රදේශවල ජල හිඟය පිළිබඳව අවධානය යොමු නොකිරීම.

- ප්‍රතිලාභීන් නිසි පරිදි පුහුණු නොකිරීම.

- ව්‍යාපෘති ආරම්භයේදී දෙන ලද පොදු උපදෙස් මාලාව අනුව " දිවිනැගුම " ව්‍යාපෘති හිමියන්ගේ ග්‍රාමීය සංවිධානයක් හෝ දිස්ත්‍රික් සංවිධානයක් ස්ථාපිත කළයුතු වුවද එවැනි ග්‍රාමීය හෝ දිස්ත්‍රික් සංවිධානයක් ක්‍රියාත්මක නොවීම.

- ජලජීවී වගා නිලධාරීන් විසින් පසුවිපරම් නොකිරීම.

(ඉ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ කර්තව්‍යයන් වෙන් වෙන්ව ගෙන සැලසුම් කිරීම වෙනුවට ප්‍රධාන මාතෘකා හතරක් යටතේ ක්‍රියාකාරකම් සැලසුම්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවට අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් වූ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කලාවැව ජාතික මිරිදිය ධීවර හා ජලජීවී පුහුණු ආයතනයේ සම්පත් දායකයන්ගේ නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා රු.මිලියන 12.62 ක් වෙන්කර තිබූ අතර ප්‍රගති වාර්තා අනුව ඒ සඳහා රු.මිලියන 10.96 ක් වැයකර තිබුණද ඒ තුල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ද්විත්ව නේවාසිකාගාරය(Twin Quarters) ඉදිකිරීම සඳහා වැයකළ රු.මිලියන 2.24 ක් ඇතුළත්කර තිබුණි.

(ii) එසේම ඉඟිනියාගල ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයේ කම්කරු නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 2.51 ක් වෙන්කර තිබුණද අදාල කාර්යය සිදු කිරීමකින් තොරව ඒ සඳහා වෙන්කළ මුදලින් ගුරුත්ව අභිජනනාගාරයේ වැඩ නිමකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ කම්කරු නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සිදුකර නොතිබියදී එහි භෞතික ප්‍රගතිය සියයට සියයක් ලෙස දක්වා තිබුණි.

(iii) මසුන් තොග කළමනාකරණය සහ ධීවර හා ජලජීවී වගා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන.1.16 ක් වෙන්කර තිබුණද ඉන් රු.මිලියන 0.79 ක් හෙවත් සියයට 32 ක් වැයකර නොතිබුණි. තවද අපේක්ෂිත ඉලක්ක දත්ත සැලැසුම් කර නොතිබීම නිසා භෞතික කාර්යසාධනය ඇගයීමට ලක්කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිවිනැගුම වැඩසටහන, චක්‍රීය අරමුදලක් ලෙස පවත්වාගෙන යාම සඳහා ලබාදුන් මුදලින් සියයට 50 ක් ආපසු අයකරගැනීමට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගතවී ආපසු අයකරගැනීම් සඳහා ක්‍රමවේද හඳුන්වා දී තිබුණද , එම ක්‍රමවේද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දිවිනැගුම ප්‍රතිලාභීන්ට ගිවිසුම් ප්‍රකාරව මූල්‍යාධාර සහ තාක්ෂණික උපදෙස් ලබා දිය යුතු අතර ප්‍රතිලාභීන් එකී තාක්ෂණික උපදෙස් වලට අනුකූලව ව්‍යාපෘති අවසන් කිරීමට ගිවිසුම් ගතවී තිබුණද , දිස්ත්‍රික් ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරීන් විසින් තාක්ෂණික උපදෙස් වලට අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවට පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි. ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කල පොදු උපදෙස් මාලාව අනුගමනය නොකිරීම, විධිමත්ව වාරික මුදල් අයකිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක නොකිරීම, මත්ස්‍ය අස්වැන්න වැඩිවීම පිළිබඳ සමීක්ෂණ දත්ත අධිකාරිය සතුව නොතිබීම, ව්‍යාපෘතිය සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු නොකිරීම වැනි දුර්වලතා පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) අධිකාරිය විසින් භාවිතා කරනු ලබන හෙක්ටයාර 38.7526 ක ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත 2017 සැප්තැම්බර් 30 දින දක්වාම පවරාගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

----------------------------

ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද රු.3,874,592 ක් වූ මුදලක් ආයෝජනය කර චේක්කයා මසුන් අභිජනනය කිරීම පිළිබඳ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2005 සැප්තැම්බර් 28 දින ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් සමඟ එක්ව ආරම්භ කර තිබුණද, අධිකාරිය හා පෞද්ගලික සමාගම අතර ඇතිවූ ගිවිසුම අනුව එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර වසර 02 ක නිදහස් කාලයකින් පසු සමාගම විසින් වසර 05 ක් තුළ මුළු මුදලම අධිකාරිය වෙත ගෙවීම් සිදුකල යුතු නමුත් 2008 දෙසැම්බර් 24 දින සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විට රු.692,726 ක් පමණක් ආපසු අයකරගෙන තිබුණි. එදිනට හිඟ ශේෂය රු.3,181,866 ක් අයකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මිරිදිය ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීමේ අරමුණින් රු.මිලියන 30 ක් අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබාදී තිබුණද ඉන් රු.මිලියන 26.1 ක් පමණක් වැයකර මත්ස්‍ය ඇඟිල්ලන් මිලියන 13 ක් පමණක් තැන්පත් කර තිබුණි. ඉතිරි රු.මිලියන 3.9 ක් මත්ස්‍ය ආහාර මිලදී ගැනීම සඳහා වැයකර තිබුණි. නමුත් අත්තිකාරම් පියවීමේදී රු.මිලියන 30 සඳහා මත්ස්‍ය පැටවුන් මිලියන 15 ක් තැන්පත්කළ බවට නිවැරදි නොවන තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත ඉංජිනේරු තනතුරු දෙකෙන් එක් තනතුරක් 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතීම නිසා සැලසුම්කළ පරිදි සම්පත්දායක නේවාසිකාගාරය ඉදිකිරීම් කටයුතු, මඩපොකුණු ඉදිකිරීම, අනෙකුත් ප්‍රතිසංස්කරණ කටයුතු සහ රැඳවුම් මුදල් රු.මිලියන 27.38 ක් නිදහස් කිරීම සඳහා ඉංජිනේරු සහතිකය ලබාගැනීම යන කාර්යයන් ඉටුකිරීමේදී ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ අධ්‍යක්ෂ මුදල් තනතුර සඳහා වාර්ෂිකව දීර්ඝ කිරීමේ කොන්ත්‍රාත් පදනම මත 2014 මැයි 06 දින සිට නිලධාරිනියක පත්කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් ස්ථිර පත්කිරීම් සිදුකිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් වූ සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ භෞතික ඉලක්කගත දත්තයන් දක්වා නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය වනවිට ආයතනය ප්‍රධාන කාර්යාලය හා මධ්‍යස්ථාන 15 ක් , දිස්ත්‍රික් කාර්යාල 22 ක් දක්වා පුළුල් වී තිබූ අතර ව්‍යාපෘතීන් රාශියක් කරගෙන යනු ලබන නමුත් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය අභ්‍යන්තර විගණක සහ කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) නිලධාරීන් දෙදෙනෙකුට සීමාවී තිබුණි. ආයතනයේ කටයුතු පුළුල් වීමත් සමඟ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව රු.මිලියන.198.94 ක ප්‍රමාණයක ගනුදෙනුවලින් සැලැස්මේ දක්වා ඇති අවදානම් සීමාව තුළට ගැනෙන සියයට 10 ත් සියයට 15 ත් අතර ගනුදෙනු ප්‍රමාණයක් පරීක්ෂාවට ලක්වී නොතිබුණි.

(ඇ) විශේෂ ව්‍යාපෘති විගණනයට අදාළ විගණන සැලැස්ම වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අන්තර්ග්‍රහණය කර නොතිබීම හේතුවෙන් විශේෂ ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

(ඈ) අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුල අභ්‍යන්තර විගණන වාර්තා 06 ක් ඉදිරිපත් කර තිබුණද , ඒ සඳහා කළමනාකරණය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග හා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. තවද කාර්තුමය විගණන වාර්තා සාරාංශ සකස්කර නොතිබුණි.

(ඉ) චෙක්පත් සඳහා පළමු අත්සන්කරු ලෙස අත්සන් කිරීමේ බලය අභ්‍යන්තර විගණකට ලබාදීම තුළින් අභ්‍යන්තර විගණන ඒකකයේ ස්වාධීනත්වය පවත්වාගැනීමට නොහැකි වී තිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ රු.3,356,972 ක් වූ පොකුණු ආවරණ දැල් මීටර් 144,000 ක් මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය පදනම් කරගෙන ලංසු ඉදිරිපත් කිරීමේ අවම කාලසීමාව දින 07 ක් ලබාදිය යුතු වුවද , ඒ සඳහා දින 02 ක කාලයක් පමණක් ලබාදී තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයෙහි ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සමහර ආදායම් ඇස්තමේන්තු කර නොතිබීම හා විචලනය සියයට 46 සිට 156 දක්වා වීමෙන් අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව වසරකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද අධිකාරිය විසින් 2015 වර්ෂයේ රැස්වීම් 03 ක් හා 2016 වර්ෂයේ රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය කළමනාකරණය | (i) සෘජු බැංකු තැන්පත් හඳුනාගැනීමට කටයුතු නොකිරීම, ණය ලබාදීමේදී ණයගැති පාලන ගිණුම් නඩත්තු නොකිරීම හා පසුවිපරම් නොකිරීම. |
| | (ii) චෙක්පත් අත්සන් කරන නිලධාරීන් සඳහා සීමාවන් අනුමත කර නොතිබීම. |
| (ආ) අත්තිකාරම් පාලනය | (i) අත්තිකාරම් පියවීමට අදාළ වවුචර් අංක ලේඛනයෙහි ඇතුළත් නොකිරීම. |
| | (ii) අත්තිකාරම් අදාල කාර්යය නිමකළ විගසම නිරවුල් කිරීමට කටයුතු නොකිරීම හා අදාල නිලධාරීන්ගේ තනතුරු නාම අත්තිකාරම් ලේඛනයෙහි සඳහන් නොකිරීම. |
| | (iii) ගිනිගත්හේන විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයේ අත්තිකාරම් ලේඛනය ක්‍රමවත්ව නඩත්තු නොකිරීම හා විශේෂ අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන නොතිබීම. |
| (ඇ) මිලදී ගැනීම් පාලනය | (i) සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා 41 කදී රු.10,398,567 ක වටිනාකම වූ මිලදීගැනීම් සඳහා සැපයුම්කරුවන්ට ඇණවුම් නිකුත්කර නොතිබීම. |
| | (ii) මිලදී ගැනීම හා ගෙවීම් අතර අභ්‍යන්තර පරීක්ෂාවන් සිදුවන පරිදි වැඩ බෙදීමක් සිදුකර නොතිබීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | - කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඉ) අභ්‍යන්තර විගණනය | (i) ප්‍රමාණවත් සහ සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් පවත්වාගැනීමට කටයුතු නොකිරීම. |

(ii) ගිනිගත්හේන විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය 2008 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදු නොකිරීම.

(ඊ) පොත්පත් ලේඛන නඩත්තුව

- විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය තුළ (ගිනිගත්හේන) ගබඩා ලේඛන පවත්වාගැනීම හා මැරුණු මත්ස්‍ය පැටවුන් පිළිබඳ ලේඛන නඩත්තුව විධිමත්ව සිදු නොකිරීම.

(උ) දිවි නැගුම චක්‍රීය අරමුදල

(i) අයකරගත යුතු වාරික අයකර නොතිබීම , ණය ලේඛන හා ලිපිගොනු යාවත්කාලීන නොකිරීම.

(ii) ප්‍රතිලාභීන් තෝරාගැනීම හා පුහුණු වීම් දුර්වල තත්ත්වයක පැවතීම.

(iii) වගා නිලධාරීන් විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබීම.

(iv) පොදු උපදෙස් මාලාව අනුව කටයුතු නොකිරීම.

(v) ව්‍යාපෘතියේ අරමුණ වන ධීවර ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සිදුවී නොමැතිවීම හා ව්‍යාපෘතිය අසාර්ථක වී තිබීම.